# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1565/19 - 2008 සැප්තැම්බර් 05 වැනි සිකුරාදා - 2008.09.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

13 (ඈඈඈ) වගන්තිය යටතේ නියෝගය

2008 අංක 9 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතින් සංශෝධිත, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 13 වගන්තියේ (ඈඈඈ) ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් සහම්පති අංගම්මන වන මා විසින් 2008/2009 තක්සේරු වර්ෂයේ සිට බලපාන පරිදි එම ඡේදයේ කාර්යයන් සඳහා මෙහි උපලේඛනයෙහි දක්වා ඇති සේවාවන් (යම් සේවා නියුක්තියකින් ඉටු කරනු ලබන එවැනි යම් සේවාවක් හැර), යම් වෘත්තියක් හෝ රක්ෂාවක් කර ගෙන යාමේදී ඉටු කරනු ලබන සේවාවන් ලෙස මෙම නියෝග මගින් නිශ්චිතව සඳහන් කරනු ලැබේ.

සහම්පති අංගම්මන ,
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්.

2008 සැප්තැම්බර් මස 03 වැනි දින,
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත,
කොළඹ 02.

උපලේඛනය

- සාමාජිකයන් විසින් පිළිපැදිය යුතු යම් පිළිගත් වෘත්තීමය සම්මතයන් සහිත, සාමාජිකයන් විසින් කරනු ලබන වෘත්තීමය ක්‍රියාකාරකම් පිළිබඳව බලාත්මක කළ හැකි සම්මතයන් සහිත වෘත්තිමය ආයතනයක සාමාජිකයෙකු වශයෙන් පුද්ගලයෙකු විසින් ඉටු කරනු ලබන සේවාවන්.
- ගිණුම් තැබීම, පොත් තැබීම හෝ විගණනය ;
- බදු උපදේශක සේවා ;
- සැලසුම් ශිල්පියෙකුගේ සේවාවන් ;
- ඉංජිනේරු සේවා ;
- මෘදුකාංග සංවර්ධනය, දත්ත සැකසීම, දත්ත සමුදායන් ගොඩ නැගීම හෝ පද්ධති සැලසුම් කිරීම ;

1A - G 010175— 1850 (2008/09)

- ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන වෙළඳ ප්‍රචාරණයන් ;
- පර්යේෂණ කාර්යයන් සහ වාර්තා ලිවීම ;
- ඡායාරූපකරණය ;
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ග්‍රන්ථ ප්‍රකාශනයන් ;
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන රූපලාවන්‍ය, හිසකෙස් සැකසීම හෝ නිරූපනය ;
- ක්‍රීඩකයෙකු හෝ කලාකරුවෙකු විසින් ඉටු කරන සේවාවන් ;
- තක්සේරුකරුවෙකු හෝ වෙන්දේසිකරුවෙකුගේ සෙවාවන් ;
- ජලනල සවිකරන්නෙකුගේ, පෙදරේරුවෙකුගේ හෝ වඩු කාර්මිකයෙකුගේ සේවාවන් ;
- ප්‍රමාණතක්සේරුකරණය ;
- සෞඛ්‍ය ආරක්ෂක සේවා ;
- ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි යම් කෘෂිකාර්මික දේපලක් පාලනය කිරීම.

09-839

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.